14.07.2023



# ද මැසිනොද් විදුහල, කඳාන
# De Mazenod College, Kandana

Learning Resource Centre
De Mazenod College
Kandana

## විද්‍යාව

පළමු වාර පරීක්ෂණය-2023 | 06 ශ්‍රේණිය | කාලය පැය 2

- ප්‍රශ්න සියල්ලටම නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

1) ජීව ක්‍රියාවක් වන සංචරණය යන්නෙන් අදහස් වන්නේ,
   1. සෙලවීමයි
   2. ආහාර ගැනීමයි
   3. ඔබ මොබ යාමයි
   4. අපද්‍රව්‍ය පිට කිරීමයි

2) ජලය මිලි ලීටර 50ක් ගෙන එය මිලි ලීටර් 100 පරිමාව ඇති බෝතලයකට දැමූ විට එහි අඩංගු ජල පරිමාව කොපමණද ?
   1. මිලි ලීටර 150
   2. මිලි ලීටර 100
   3. මිලි ලීටර 50
   4. කිව නොහැක

3) ශාක භක්ෂක සතුන් පමණක් ඇති කාණ්ඩය තෝරන්න.
   1. මී මැස්සා, කපුටා, පත්තෑයා
   2. මී මැස්සා, හරකා, කපුටා
   3. සමණලයා, හරකා, ගෙම්බා
   4. මී මැස්සා, සමණලයා, හරකා

4) විෂම පෝෂී ජීවියෙකු වන්නේ,
   1. උඳුපියලිය
   2. උක්ගස
   3. පැම්සියම්
   4. අඹ ගස

5) ඝන, ද්‍රව, වායු, අවස්ථා සියල්ල දැකිය හැකි ද්‍රව්‍ය පමණක් අඩංගු කාණ්ඩය වන්නේ,
   1. ඉටි, මැටි
   2. ඉටි, දර
   3. ඉටි, ජලය
   4. ඉටි, හඳුන්කූරු

6) ළදරු කිරි බොන සූප්පු සඳහා රබර් යොදා ගන්නේ,
   1. දිගු කලක් පවතින නිසාය
   2. විනිවිද පෙනෙන නිසාය
   3. හංගුර නොවන නිසාය
   4. ප්‍රත්‍යාස්ථ ගුණය නිසාය

7) සියළු ක්ෂුද්‍ර ජීවීන්,
   1. විෂමපෝෂීන් වේ
   2. ස්වයංපෝෂීන් වේ
   3. ජීවීන්ට හානිදායකය
   4. තනි තනිව ගත්කල පියවි ඇසට නොපෙනේ

8) මුහුදු ජලයේ ලුණු රසට හේතුවන ලවණය වන්නේ,
   1. සෝඩියම් ක්ලෝයිඩ්
   2. කැල්සියම් ක්ලෝරයිඩ්
   3. කැල්සියම් කාබනේට්
   4. සෝඩියම් කාබනේට්

9) ස්කන්ධය ප්‍රකාශ කිරීමේ ජාත්‍යන්තර සම්මත ඒකකය වන්නේ,
   1. මිලිග්‍රෑම් ය
   2. කිලෝග්‍රෑම් ය
   3. ග්‍රෑම් ය
   4. සෙන්ටිග්‍රෑම් ය

10) වර්ෂණයේ ස්වරූප නොවන්නේ,
   1. හිමකැට වැස්ස
   2. හිමකුණාටු
   3. අයිස්කැට වැස්ස
   4. උල්පත් ජලය

11) මෙම ක්‍රියාකාරකමින් පෙන්වන්නේ X නම් පදාර්ථය සතු කවර ගුණයද?




1. නිශ්චිත පරිමාවක් ඇත
2. නිශ්චිත හැඩයක් ඇත
3. අවකාශයේ ඉඩක් ගනී
4. ස්කන්ධයක් ඇත

12) යම් පදාර්ථයක් සතුව පහත ලක්ෂණ පවතී,

- නිශ්චිත හැඩයක් ඇත
- නිශ්චිත පරිමාවක් ඇත
- ස්කන්ධයක් සහිතය

මෙම ලක්ෂණ වලින් යුක්ත පදාර්ථය විය හැක්කේ

1. ද්‍රවයක්
2. වායුවක්
3. ඝනයක්
4. එකක්වත් නොවේ

13) යම් ද්‍රව්‍යක මෘදු හෝ රළු බව හඳුන්වන්නේ,

1. භංගුර බව
2. වයනය
3. තන්‍යතාවය
4. අභන්‍ය බව

14) පදාර්ථ හා ශක්ති පිළිබඳව ප්‍රකාශ පහත දක්වේ ඒවා අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. වාතයට ස්කන්ධයක් නැත, එබැවින් වාතය ශක්තියකි
2. ආලෝකය අවකාශයේ ඉඩක් නොගන්නා අතර ස්කන්ධයක්ද නැති නිසා ආලෝකය ශක්තියකි
3. ධ්වනිය ශක්තියක් වන අතර එය අවකාශයේ ඉඩක් ගනී,
4. ගඩොලක් අවකාශයේ ඉඩක් නොගන්නා අතර ස්කන්ධයක් සහිතය එබැවින් එය පදාර්ථයකි.

15) පහත ක්‍රියාකාරකම මගින් නිරීක්ෂණය කිරීමට බලාපොරොත්තු වන්නේ,



1. ජලය පවතින අවස්ථා හඳුනාගැනීම
2. වායුගෝලයේ ජලවාෂ්ප පවතිදැයි පරීක්ෂා කිරීම
3. ජලය පවතින විවිධ ආකාර හඳුනා ගැනීම
4. ජලයේ ලවණතාවය පරීක්ෂා කිරීම

16) නිවැරදි වගන්තිය තෝරන්න.

1. මුහුදු මල සංචරණය කරන ජීවියෙකි
2. මුහුදු මල ඔත් ජීවිතයක් ගතකරන ජීවියෙකි
3. කාබන්ඩයොක්සයිඩ් ශ්වසනයේදී ලබා ගන්නා වායුවකි
4. ඔක්සිජන් වායුව හුණු දියර කිරි පාටට හරවයි

17) ඝන අයිස් $\xrightarrow[\text{කිරීම}]{\text{රත්}}$ (a) - - - $\xrightarrow[\text{කිරීම}]{\text{රත්}}$ (b) - - - - - -

ඉහත සටහනේ (a) හා (b) ස්ථානවල යෙදෙන වචන පිළිවෙලින්,

1. ජලවාෂ්ප, අයිස්
2. අයිස්, ද්‍රවජලය
3. ද්‍රවජලය, ජලවාෂ්ප
4. ජලවාෂ්ප, ද්‍රවජලය

18) දෘඪ බවින් ඉහලම අගයක් ගන්නා ද්‍රව්‍ය වන්නේ,

1. හුණු
2. මැණික්
3. සීනි
4. දියමන්ති

19) වෙරළබඩ පරිසරයේ වැඩෙන ශාකයකි

1. කුරුළු කැදලි
2. හිංපොල්
3. ජපන්ජබර
4. වැටකෙයියා

20) නිවසක සියළුම සාමාජිකයින් විසින් පරිභෝජනය කරනු ලබන ජල පරිමාව හඳුන්වන්නේ,

1. ජල ඒකකයක් ලෙසිනි
2. ඒක පුද්ගල ජල පරිභෝජනය ලෙසිනි
3. ජල පරිමාව ලෙසිනි
4. ගෘහස්ත ජල පරිභෝජනය ලෙසිනි

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව මුළු ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

1) 6 ශ්‍රේණියේ සිසුන් ජෛව ලෝකයේ අසිරිය පාඩම යටතේ අධ්‍යයනය කල ජීවින් තිදෙනෙකුගේ රූප පහත දක්වේ.




a)

i. A,B හා C ජීවින් නම් කරන්න. ල.3
ii. ඔවුන් ජීවත්වන පරිසරය කුමක්ද? ල.1
iii. B ජීවියා අයත් ජීවී ඛාන්ඩය කුමක්ද ? ල.1
iv. B ජීවියා නිරීක්ෂණය සඳහා සුදුසු උපකරණය කුමක්ද ? ල.1
v. B ජීවී කාණ්ඩයෙන් මිනිසාට ඇති අවාසි දෙකක් ලියන්න. ල.2
vi. A ජීවියා හා අඹ ගසක් අතර ඇති සාමානකමක් හා අසමානකමක් ලියන්න. ල.2
vii. B හා C ජීවින්ගේ සංචරන ක්‍රම මොනවාද ? ල.2
viii. C ජීවියාගේ ශ්වසන අවයවය කුමක්ද? ල.1
ix. ජීවින් ශ්වසනයේදි පිටකරන වායුව කුමක්ද? ල.1
x. එම වායුව හඳුනාගැනීමට විද්‍යාගාරයේදි ඔබ භාවිතා කල දියරය කුමක්ද ? ල.1
xi. ශාක ප්‍රභාසංස්ලේෂණයේදි පරිසරයට මුදාහරින වායුව කුමක්ද ? ල.1

2)ඝන පදාර්ථයේ ගුණ සොයා බැලීමට දරුවන් පිරිසක් සංවිධානය කරන ලද ක්‍රියාකාරකමකට යොදාගත් ද්‍රව්‍ය කිහිපයක් පහත දක්වේ,

( යකඩ ඇණයක්, ටින් තහඩුවක්, තිරිඟු පිටි, රටහුණු කැබැල්ලක්, වැලි ස්වල්පයක්, අඟුරු කැබැල්ලක්, රබර් පටියක්, යකඩ කම්බි කැබැල්ලක්, තඹ කම්බි කැබැල්ලක්, පවුඩර් ස්වල්පයක් )

i. ඉහත ද්‍රව්‍ය අතරින් ස්පර්ශ කල විට සිනිඳු බවක් දනෙන ද්‍රව්‍යයක් නම් කරන්න. ල.2
ii. මිටියකින් ගැසු විට කුඩුවන ද්‍රව්‍යයක් ලියන්න එම භෞතික ගුණය කුමන නමකින් හැඳින්වේද ල.2
iii. මේවා අතර ඇති තන්‍ය ද්‍රව්‍යයක් ලියන්න. ල.1
iv. ඉහත iii. හි ඔබ නම් කල ද්‍රව්‍යයේ ප්‍රයෝජනයක් ලියන්න. ල.1
v. ළදරු සුප්පු හා අත් ආවරණ සෑදීමට ගන්නා ද්‍රව්‍යයේ තිබිය යුතු භෞතික ගුණයක් ලියන්න. ල.1
vi. වැලි කඩදාසි භාවිතයට ගන්නා අවස්ථාවක් ලියන්න. ල.1
vii. උචිත නොවන ද්‍රව්‍ය භාවිතා කර එදිනෙදා කටයුතු කිරීමෙන් මිනිසාට මුහුණ පැමට සිදුවන ගැටළු 2ක් ලියන්න. ල.2

3)පෘථිවිය මත ජලය ඝන, ද්‍රව, වායු අවස්ථා 3කින් පවතී,

i.

a) පෘථිවිය මත ඝන අවස්ථාවේ ජලය පවතින ආකාර 2ක් ලියන්න. ල.2
b) ස්වභාවිකව වර්ෂණය මගින් පෘථිවියට ජලය ලැබේ. වර්ෂණයේ ආකාර 2ක් ලියන්න ල.2

ii. ජල දූෂණය යනු කුමක්ද ? ල.1
iii. ජල දූෂණයට හේතුවන මිනිස් ක්‍රියාකාරකම් 2ක් ලියන්න. ල.2
iv. දූෂණය වූ ජලය හා දූෂණය නොවූ ජලය අතර වෙනස්කම් 2ක් ලියන්න. ල.2
v. පාසලේදී ජලය අපතේ යන අවස්ථාවක් ලියන්න. ල.1
vi. අපතේ යන ජලය තැන් තැන්වල එක්රැස් වීමෙන් මදුරුවන් බෝවීම සිදුවේ. මදුරුවන්ගෙන් පැතිර යන රෝගයක් නම් කරන්න. ල.1

4)ජලය පවතින අවස්ථා හඳුනාගැනීම සඳහා කළ ක්‍රියාකාරකමක උපකරණ පහත රූපසටහනේ දක්වා ඇත.




i. මෙහි දක්වා ඇති A,B,C නම් කරන්න. ල.3

ii. මෙහිදී දැකිය හැකි නිරීක්ෂණයක් ලියන්න. ල.1

iii. පරීක්ෂණ නලය තුල ඇති අයස්කැට දිගින් දිගටම රත්කරණ විට දකිය හැකි නිරීක්ෂණයක් ලියන්න.

iv. C උපකරණය භාවිතා කිරීමේ ප්‍රයෝජනයක් ලියන්න. ල.1

v. ජලයට නිශ්චිත හැඩයක් නැත. එය අඩංගු භාජනයේ හැඩය ගනී. මේ බව පෙන්වීමට සුදුසු රූප සටහනක් අඳින්න. ල.2

vi. ඉහත ඇටවුමේ A වෙනුවට විද්‍යාගාරයේදී භාවිතා කල හැකි වෙනත් උපකරණයක් ලියන්න. ල.1

vii. පෘථිවියේ ද්‍රව අවස්ථාවේ පවතින ජලය දැකිය හැකි ස්ථාන 2ක් ලියන්න ල.2

5) A- පහත සඳහන් ශාක වැඩෙන පරිසරය අනුව විවිධත්වයක් දක්වයි. ඒ අනුව පහත වගුව පුරවන්න.
( වැටකෙයියා / බිම්තඹුරු / නෙළුම් / අඹ / ජපන් ජබර / මල්කඩොල් / කටු ඉකිලිය /රඹුටන් / සැල්වීනියා / කිරල )

| ජලජ | භෞමික | වෙරළබඩ | කඩොලාන |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

B- පහත දක්වෙන දෙබෙදුම් සුචියේ හිස්තැන් වලට සුදුසු පිළිතුර ලියන්න.
(දෙබෙදුම් සුචිය පිළිතුර පත්‍රයේ පිටපත් කරගෙන හිස්තැන් පුරවන්න )

( මාළුවා , කුකුළා, අලියා, ගවයා, නයා, ගිරවා )

පාද 4ක් ඇති — d. ................

a........, ගවයා ) — ( මාළුවා, කුකුළා, e............, ගිරවා)

b....... — හොඬවැලක් නැති — පිහාටු සහිත — f...............

(c.........) — (ගවයා) — (කුකුළා, g...........) — (h....., නයා )

වක්‍රහොටක් ඇති — i........ — කරමල් ඇති — කරමල්නැති

(j.......) — (k.......) — (මාළුවා) — (L........)